# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2473/05 - 2026 ජනවාරි මස 26 වැනි සඳුදා - 2026.01.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### උතුරු මැද පළාතේ පළාත් සභාව

### උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත් කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 ඊ (1) හා (2) වගන්තිවල දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ අංක 32(1) වගන්තියේ දක්වා ඇති විධිවිධාන යටතේ උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එතුමා විසින් 2026.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු මැද පළාත් සභාවට අයත් පළාත් අමාත්‍යාංශ 05 හි විෂයන් පහත දක්වා ඇති පරිදි සංශෝධනය කර එම නව පළාත් අමාත්‍යාංශවල ලේකම් තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීම් සිදු කර ඇති බව ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි මෙයින් නිවේදනය කරමි.

01. උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශවල විෂය සංශෝධනය අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ - කේ.එම්. එච්.එස්.කේ. ජයලත් මහතා 2026.02.01 දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, විශේෂ ව්‍යාපෘති, සංචාරක ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම් වශයෙන්.

02. උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශවල විෂය සංශෝධනය අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ - එම්. ශ්‍රීස්කන්ද කුමාර් මහතා 2026.02.01 දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් සමුපකාර, වෙළඳ හා අහාර, ප්‍රවාහන, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශ ලේකම් වශයෙන්.

03. උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශවල විෂය සංශෝධනය අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ - ආර්.එම්. ඩී.පී. පුෂ්ප කුමාරි මහත්මිය 2026.02.01 දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සේවා හා සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශ ලේකම් වශයෙන්.

04. උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශවල විෂය සංශෝධනය අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ - සුභාජිනී මදියලගන් මහත්මිය 2026.02.01 දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් කෘෂිකර්ම, ඉඩම් හා වාරිමාර්ග, කෘෂි නිෂ්පාදන අළෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශ ලේකම් වශයෙන්.

1A - PG 7494 — 04 (2026/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශවල විෂය සංශෝධනය අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ - එස්. ගුණපාලන් මහතා 2026.02.01 දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාතේ පළාත් පාලන, මහා මාර්ග, ග්‍රාම සංවර්ධන, නිවාස, පරිසර හා වනිතා කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශ ලේකම් වශයෙන්.

**නන්දන ගලබොඩ,**
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2026 ජනවාරි මස 21 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

EOG 01 - 0267

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.